46200

සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
**Department of Education - Western Province**

වර්ෂ අවසාන ඇගයීම
ஆண்டிறுதி மதிப்பீடு - 2016
**Year End Evaluation**

1 - 12 - 2016

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: 08 | විෂයය / பாடம் / Subject: බුද්ධ ධර්මය | පත්‍රය / வினாத்தாள் / Paper: I, II | කාලය / காலம் / Time: පැය 02 |

නම :- .................................................... විභාග අංකය :- ....................

Learning Resource Center
De Mazenod College
Kandana

සැලකිය යුතුයි:
(i) ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.
(ii) දී ඇති පිළිතුරු අතරින් වඩාත් නිවැරදි පිළිතුර තෝරා එම පිළිතුර යටින් ඉරක් අඳින්න.

---

(01) බුදුරජාණන් වහන්සේ යශෝධරා දේවියගේ ගුණ වර්ණනා කරමින් දේශනා කරනු ලැබුවේ,
(1) මහා ධර්මපාල ජාතකයයි (2) සඳ කිඳුරු ජාතකයයි
(3) වෙස්සන්තර ජාතකයයි (4) ලෝමහංස ජාතකයයි

(02) බුදුරජාණන් වහන්සේට කිඹුල්වත්පුර ශාක්‍යයන් විසින් පූජා කළ ආරාමය වූයේ,
(1) වේළුවනාරාමයයි (2) ජේතවනාරාමයයි
(3) නිග්‍රෝධාරාමයයි (4) අශෝකාරාමයයි

(03) පරලොව අදහාගෙන දෙන දානය වුවද පිළිගැනීමට සුදුසු වූ හෙයින් මහා සංඝරත්නය,
(1) ආහුණෙය්‍යා වේ (2) පාහුණෙය්‍යා වේ
(3) දක්ඛිණෙය්‍යා වේ (4) අඤ්ජලීකරණීය වේ

(04) උපතිස්ස හා කෝලිත පිරිවැජියන් දෙදෙනා බුද්ධ ශ්‍රාවකයන් බවට පත්වීමට පෙර ඔවුන්ගේ ආචාර්යවරයා වූයේ,
(1) පොට්ඨපාද පරිබ්‍රාජකයාය
(2) සංජය පරිබ්‍රාජකයාය
(3) සකුළුදායී පරිබ්‍රාජකයාය
(4) නිග්‍රෝධ පරිබ්‍රාජකයාය

(05) පුද්ගලයෙකුගේ උපතේ සිට මරණය දක්වාම සංඝරත්නයේ ආශිර්වාදය ගිහියාට නැතිවම බැරිය. දරුවකු බිහි කිරීමට පෙර ගැබිණි මාතාවකට ආශිර්වාද කිරීම සඳහා සංඝරත්නය විසින් භාවිත කරන පිරිත් දේශනාව වන්නේ,
(1) අටවිසි පිරිතය (2) ජය පිරිතය
(3) මෝර පිරිතය (4) අංගුලිමාල පිරිතය

(06) බුදුරජාණන් වහන්සේගේ උපදේශයට අනුව තෙරුවන් ගුණ ඇතුළත් ගාථා තුනක් ගයමින් මහ මග ගමන් කරමින් සිටිය දී මරණයට පත්ව දෙව්ලොව උපත ලැබුවේ,
(1) මඝ මානවකයා ය (2) ඡත්ත මානවකයා ය
(3) සුභ මානවකයා ය (4) සිගාලක මානවකයා ය

(07) භික්ෂූන් වහන්සේලාගේ දක්ෂතාවන් හා පිරූ ගුණ දහම් සැලකිල්ලට ගෙන ධෛර්යය සම්පන්න වූවන් අතුරින් අග තනතුර පිරිනමනු ලැබුවේ,
(1) ආනන්ද හිමියන්ටය (2) සැරියුත් මහ රහතන් වහන්සේටය
(3) මුගලන් මහ රහතන් වහන්සේට ය (4) නන්ද හිමියයන්ට ය

(08) ''මිතුරු තුමෝ - දුක සැප දෙකෙහිම පැවතී
බිතු සිතුවම් රූමෙන් - පිටු නොපා විතී''
මෙම පද්‍යයෙන් විස්තර කෙරෙන්නේ,
(1) උපකාරක මිත්‍රයාය (2) සමාන සුඛ දුක්ඛ මිත්‍රයාය
(3) අත්ථක්ඛායී මිත්‍රයාය (4) අනුකම්පක මිත්‍රයාය

(09) කර්ම ඵල විපාක පිළිබඳව ඉගැන්වෙන චූල්ලකම්ම විභංග සූත්‍රයෙහි දක්වෙන පරිදි සතුනට හිංසා පීඩා කරන අයට ලැබෙන විපාකය නම්,
(1) උසස් කුලවල නොඉපදීමය
(2) යස ඉසුරු අඩු වීමය
(3) නිතර ලෙඩ රෝග වලට ගොදුරු වීමය
(4) අශෝභනව ඉපදීමය

(10) දුක්ඛ ආර්ය සත්‍යයෙහි විස්තර කෙරෙන ''ඉච්ඡිත අලාභ දුක්ඛය'' යනු,
(1) නිතර ලෙඩ දුක් වලට ගොදුරු වීමය
(2) ඉඳුරන් මුහුකුරා යමින් මහලු බවට පත්වීමය
(3) තමා කැමති දේ නොලැබී යාමය
(4) විවිධ කරදර හිරිහැර ඇති වී චිත්ත පීඩාවට පත් වීමය

(11) බුදුරජාණන් වහන්සේ අන්‍ය ආගමිකයන්ගේ ආරාම වෙත වැඩම කළේ තම අනුගාමිකයින් වැඩිකර ගැනීමේ අරමුණින් නොවෙති. මේ බව මැනවින් පැහැදිලි කර දෙන සූත්‍ර දේශනාව වන්නේ,
(1) චක්කවත්ති සීහනාද සූත්‍රයයි (2) උදුම්බරික සීහනාද සූත්‍රයයි
(3) සිංසපා සූත්‍රයයි (4) අරිය පරියේසන සූත්‍රයයි

(12) බුදුරජාණන් වහන්සේ පිරිනිවන් පෑමෙන් පසු ශ්‍රී දේහය ආදාහනය කළ චිතකයෙන් වම් දළදා වහන්සේ ලබා ගෙන ඇත්තේ,
(1) සරභූ රහතන් වහන්සේ ය (2) ඛේම රහතන් වහන්සේ ය
(3) බක්කුල රහතන් වහන්සේ ය (4) මහා කාශ්‍යප රහතන් වහන්සේ ය

(13) ශාසන ඉතිහාසයේ සඳහන් වන ථේරවාදී ධර්ම සංගායනා අතර ''සත්ත සතිකා සංගීතිකාව'' යනුවෙන් හැඳින්වූයේ,
(1) පළමු ධර්ම සංගායනාවයි (2) දෙවන ධර්ම සංගායනාවයි
(3) තෙවන ධර්ම සංගායනාවයි (4) සිව්වන ධර්ම සංගායනාවයි

(14) බුදු දහමෙහි පෙන්වා දෙන මිත්‍ර ප්‍රතිරූපකයන් අතර තම මිතුරාට සුළු දෙයක් දී වැඩි යමක් බලාපොරොත්තු වන මිතුරා වන්නේ,
(1) අඤ්ඤදත්ථුහර ය (2) වචීපරම ය
(3) අනුප්පියභාණී ය (4) අපාය සහය ය

(15) බුදුරජාණන් වහන්සේ පුද්ගල දියුණුවට හේතුවන කරුණු පැහැදිලි කරමින් මහා මංගල සූත්‍රය දේශනා කළේ,
(1) බ්‍රහ්මයින්ට ය (2) දෙවියන්ට ය
(3) මනුෂ්‍යයින්ට ය (4) ප්‍රේතයින්ට ය

(16) රාජ්‍ය පාලන ප්‍රතිපත්ති අතර දානය, සීලය, පරිත්‍යාගය ආදී වූ ප්‍රතිපත්තීන් ඇතුළත් වනුයේ,
(1) දසරාජ ධර්මවල ය (2) සප්ත අපරිහානීය ධර්මවල ය
(3) දස සක්විතිවත්වල ය (4) සතර සංග්‍රහ වස්තුවල ය

(17) දළදා සිරිත පිළිබඳ වර්ණනා කෙරෙන සැළලිහිණි සංදේශය රචනා කරන ලද්දේ,
(1) වීදාගම මහා මෛත්‍රී හිමියන් විසිනි (2) තොටගමුවේ ශ්‍රී රාහුල හිමියන් විසිනි
(3) වැලිවිට ශ්‍රී සරණංකර හිමියන් විසිනි (4) මිගෙට්ටුවත්තේ ගුණානන්ද හිමියන් විසිනි

(18) තමා උපමා කොට ගනිමින් අනනුට අවැඩක් සිදුවන දේවල්වලින් වැලකී සිටීම බුදු දහමෙහි හඳුන්වන්නේ,
(1) අත්තාධිපති ධර්මය නමිනි (2) ලෝකාධිපති ධර්මය නමිනි
(3) ධම්මාධිපති ධර්මය නමිනි (4) අත්තූපනායික ධර්මය නමිනි

(19) බෞද්ධ සංඝ සමාජය ආචාරශීලී ප්‍රසන්න සංවිධානයක් බවට පත් කර ගැනීමේ අරමුණින් බුදුරජාණන් වහන්සේ විසින් හඳුන්වා දුන් ශික්ෂණ විධි සමූහය නම්,
(1) සේඛියා ධර්මය ය. (2) ආසව ධර්මය ය.
(3) ආශ්‍රම ධර්මය ය. (4) ආපද් ධර්මය ය.

(20) බුදු දහම පෙන්වා දෙන පරිදි මිනිසාට ලැබියහැකි වටිනාම ධනය නම්,
(1) නිරෝගී බවයි (2) සතුටයි (3) විශ්වාසයයි (4) නිවනයි

(ලකුණු 20 x 2 = 40)

## II කොටස

- පළමු ප්‍රශ්නයට සහ තවත් ප්‍රශ්න හතරකට පිළිතුරු ලියන්න.
- පළමු ප්‍රශ්නයට ලකුණු 20කි.
- අනෙකුත් ප්‍රශ්න සඳහා ලකුණු 10 බැගිනි.

(01) ඔබට බුද්ධ ධර්ම විෂයට අදාළව තුන්වන වාරයට නියමිත ඇගයීම වූයේ නායකත්ව ලක්ෂණ උපයෝගී කරගෙන යහපත් ආර්ථිකයක් ගොඩ නැංවීමේ කරුණු තහවුරු කරන රාජ ධර්ම පිළිබඳ සංවාදශීලී ළමා පාර්ලිමේන්තුවකි. එම ඇගයීමට අදාළව පහත ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න.
(1) ඔබ ළමා පාර්ලිමේන්තුව තුළින් ලැබූ අත්දැකීම් දෙකක් ලියන්න.
(2) ළමා පාර්ලිමේන්තුවේ කටයුතු සංවිධානය කිරීමට ඔබට ගුරුතුමාගෙන් ලැබුණු උපදෙස් දෙකක් ලියන්න.
(3) ළමා පාර්ලිමේන්තුවේ සිටින ප්‍රධානීන් දෙදෙනෙකු නම් කරන්න.
(4) නායකයකු තුළ තිබිය යුතු ගුණාංග දෙකක් ලියන්න.
(5) ළමා පාර්ලිමේන්තුවේ කටයුතු කිරීමේ දී ඔබ තුළ ගොඩනගා ගත යුතු ආචාර ධර්ම දෙකක් ලියන්න.
(6) අතීතයේ අපේ රටේ දැහැමිව රාජ්‍ය පාලනය කළ රජවරුන් දෙදෙනෙකු නම් කරන්න.
(7) බුදු දහමට අනුව "රජ" යන වචනයෙන් අදහස කුමක් ද?
(8) දැහැමි රාජ්‍ය පාලකයකු අනුගමනය කළ යුතු යැයි බුදුරජාණන් වහන්සේ පෙන්වා දුන් රාජ්‍ය පාලන ප්‍රතිපත්ති දෙකක් නම් කරන්න.
(9) මී කුණක් විකුණා සිටුවරයකු බවට පත්වූ නැණවත් තරුණයකු පිළිබඳ සඳහන් වන ජාතක කථාව කුමක් ද?
(10) එම ජාතක කතාවෙන් ඔබට ගත හැකි ආදර්ශ දෙකක් ලියන්න. (ලකුණු 2 x 10 = 20)

(02) දුක හමුවේ උදාසීන නොවී ධෛර්යයෙන් යුතුව දුකට මුහුණ දිය යුතු ආකාරය බුදුරජාණන් වහන්සේ චතුරාර්ය සත්‍ය දේශනාවෙන් මනාකොට දේශනා කර ඇත.
(1) චතුරාර්ය සත්‍ය පිළිබඳ ඉගැන්වෙන සූත්‍ර දේශනාවක් නම් කරන්න. (ලකුණු 02)
(2) දුකට හේතු වූ තෘෂ්ණාවේ ප්‍රභේද තුන මොනවා ද? (ලකුණු 03)
(3) ගංවතුර උවදුරින් බොහෝ දේ අහිමිව දුකට පත්ව සිටින ඔබගේ මිතුරෙකු සැනසීම සඳහා ඔබ ලබාදෙන උපදෙස් හා උපකාර පිළිබඳ පැහැදිලි කිරීමක් කරන්න. (ලකුණු 05)

(03) ථේරවාදී බුදු දහම එදා සිට අද දක්වා ආරක්ෂා කරගෙන ඒම සඳහා ධර්ම සංගායනාවලින් ලැබුණු මෙහෙය අපමණ ය.

(1) දෙවන ධර්ම සංගායනාවට අනුග්‍රහය දක්වූ රජතුමා හා පැවැත්වූ ස්ථානය නම් කරන්න. (ලකුණු 02)

(2) දෙවන ධර්ම සංගායනාවට බලපෑ ප්‍රධාන හේතුව කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 03)

(3) බුදු සසුන නිර්මලව පවත්වාගෙන ඒම සඳහා ධර්ම සංගායනාවන් මගින් ලැබුන ප්‍රයෝජන පෙන්වා දෙන්න. (ලකුණු 05)

(04) මංගල කරුණු පිළිපැදීමෙන් පුද්ගලයාට දෙලොවම ජය ගත හැකිය.

(1) මංගල සූත්‍රයේ සඳහන් මංගල කරුණු සංඛ්‍යාව කොපමණ ද? (ලකුණු 02)

(2) බුද්ධ කාලීන දඹදිව විසූ මංගලිකයො වර්ග තුන නම් කරන්න. (ලකුණු 03)

(3) මංගල සූත්‍රයේ සඳහන් මංගල කරුණු අතරින් ශිෂ්‍ය ජීවිතයට වඩාත් වැදගත් වන කරුණු හතරක් තෝරාගෙන ජීවිත සාර්ථකත්වයට ඒවා හේතුවන අයුරු පෙන්වා දෙන්න. (ලකුණු 05)

(05) සරු නිසරු දෙය තේරුම්ගෙන ජීවත්වීමේ අවශ්‍යතාව බුදු දහමේ මැනවින් පෙන්වා දෙයි.

(1) සැලියක් වී සිට යලි හැන්දක් වීමට තමන් අකමැති බව පවසමින් බුදුරජාණන් වහන්සේ හමුවට යාම ප්‍රතික්ෂේප කළ පරිබ්‍රාජකයා කවුරුන් ද? (ලකුණු 02)

(2) ඔහු අරමුණු කරමින් බුදුරජාණන් වහන්සේ දේශනා කළ "අසාරේ සාරමතිනෝ...." යන ගාථාව සම්පූර්ණ කරන්න. (ලකුණු 03)

(3) නිසරු දෙයින් වෙන්ව සරුදේ පමණක් අනුගමනය කරමින් ඔබගේ ජීවිතය සාර්ථක කර ගන්නා අයුරු පෙන්වා දෙන්න. (ලකුණු 05)

(06) පරිසරයට මා නැතිව බොහෝ කල් පැවතිය හැකිය. එහෙත් මට පරිසරය නොමැතිව මොහොතක් හෝ පැවතිය නොහැකිය.

(1) පරිසරයේ ප්‍රධාන ප්‍රභේද දෙක කුමක් ද? (ලකුණු 02)

(2) පරිසරයෙන් අපට ලැබෙන ප්‍රයෝජන තුනක් ලියන්න. (ලකුණු 03)

(3) පරිසරය ආරක්ෂා කිරීමට ඔබට ගත හැකි ක්‍රියා මාර්ග මොනාවාදයි පැහැදිලි කරන්න. (ලකුණු 05)

(07) බුදුරජාණන් වහන්සේගේ ස්ථිර අග්‍ර උපස්ථායක තනතුර දරූ ආනන්ද හිමියෝ තම දිවි දෙවෙනි කොට බුදුරජාණන් වහන්සේ වෙනුවෙන් ක්‍රියා කළහ.

(1) ආනන්ද හිමියන්ට පෙර වරින් වර බුදුරජාණන් වහන්සේට උපස්ථාන කළ හිමිවරු දෙනමක් නම් කරන්න. (ලකුණු 02)

(2) අග්‍ර උපස්ථායක තනතුරට අමතරව ආනන්ද හිමියන් ලැබූ වෙනත් අග තනතුරු තුනක් ලියන්න. (ලකුණු 03)

(3) ආනන්ද හිමියන්ගේ චරිතයෙන් ඔබට ගත හැකි ආදර්ශ පහක් ලියන්න. (ලකුණු 05)